**ශීර්ෂ 171- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති කොමිෂන් සභාව**

| **ශීර්ෂ** | **කොමිෂන් සභාව** |
|---|---|
| **214** | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව** |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් **උසස් අධ්‍යාපන** අමාත්‍යාංශය හා **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්** සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්** සභාවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂ** | **අමාත්‍යාංශය සහ කොමිෂන් සභාව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 171 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 2015 ඔක්තෝබර් 06 |
| 214 | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව** | 2015 අගෝස්තු 26 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සළසා තිබුණු රු.මිලියන 39,963.7 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 38,746.3 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා කොමිෂන් සභාවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 69.4 ක් හා රු.මිලියන 1,148 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.8 ක් හා සියයට 3.6 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 171 | 8,177.7 | 8,108.3 | 69.4 | 0.8 |
| 214 | 31,786.4 | 30,638.2 | 1,148.2 | 3.6 |
| එකතුව | 39,964.1 | 38,746.5 | 1,217.6 | 3.0 |

## 2.2 අත්තිකාරම් ගිණුම

## 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 17101 | 5.0 | 4.9 | 2.2 | 4.2 | 18.0 | 13.4 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 355.7 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්** සභාවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරික්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වු ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂ 171- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

## 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
| --- | --- | --- | --- |
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලින කර පවත්වා නොතිබුණි. |
| (ආ) | සුළු මුදල් පොත | මුදල් රෙගුලාසි 446 | පවත්වා නොතිබුණි. |
| (ඇ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | පවත්වා නොතිබුණි. |
| (ඈ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කළ විගණන විමසුම් තුනකට 2015 සැප්තැම්බර් 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

**3.3.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 04 ක් සඳහා එකතුව රු.2,010,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශය වෙත අග්‍රිම අපේක්ෂිත පරිදි නිකුත් නොකිරිම නිසා එම ප්‍රතිපාදනයන්ගෙන් රු.835,143 ක් පමණක් උපයෝජනය කිරිමට සිදු වි තිබුණි. ඒ අනුව එකතුව රු.1,174,857 ක් හෙවත් වැය විෂයයන් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 සිට සියයට 82 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි

(ආ) වැය විෂයයන් 2 කට සළසා තිබුණු එකතුව රු.27,993,968 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ඇ) වැය විෂයයන් 3 කට රු.9,633,003 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 67 ක සිට සියයට 82 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඈ) විදේශ ආධාර සම්බන්ධ දේශීය අරමුදල් රු.මිලියන 87 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 61.8 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර ඒ අනුව ඉතිරිය සියයට 29ක් විය.

## 3.4 පොදු තැන්පත් ගිණුම

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය විසින් පවත්වනු ලැබූ වැඩසටහනේ වියදම් සඳහා 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතියෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ලබාදුන් රු.956,760 ක් අදාල කාර්යයට නොයොදවා පොදු තැන්පත් ගිණුමේ 2015 අගෝස්තු 31 දින වන විටත් රඳවා තිබුණි.

(ආ) විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශයට ලැබී පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණු රු.2,610,629 ක මුදල නායකත්ව පුහුණු වැඩසටහනට යොදවාගෙන තිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-------------------------------------------------------------------------

විෂය අංක 17101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 455,328 ක්වූ අතර, එයින් හිඟහිටි රු.290,210 ක ශේෂ වර්ෂ 8 සිට වර්ෂ 21 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි. විස්තර පහත දැක්වේ.

(i). හිඟ හිටි කාලය වර්ෂ 21 සිට වර්ෂ 23 ක් දක්වා වූ වෙනත් රාජ්‍ය ආයතන වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 35,690 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ii). 2006 වර්ෂයේදී සේවය හැරගිය සේවකයෙකුගෙන් රු.58,926 ක් අයවිය යුතුව තිබුණද, 2015 ජුනි 30 දින වන විටත් එම ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii). 1991 වර්ෂයේ සිට 1994 වර්ෂය දක්වා කාලය තුළ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට පවරා දිය යුතු එකතුව රු.175,594 ක ණය ශේෂ 09 ක් වර්ෂ 20 ක කාලයක් ගත වී තිබුණද එම ශේෂ නිරවුල් කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

**අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.**

(අ) **ජංගම නොවන වත්කම්**

අමාත්‍යාංශයේ එකතුව රු.18,700,000 ක් වටිනා වාහන තුනක් ජංගම නොවන වත්කම් පිළිබඳ සංචලන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණු අතර පිරිවැය රු.7,800,000 ක වාහනයක් සමාලෝචිත වර්ෂයේදී අපහරණය කළද එහි අගය එම වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) 2015 ජූලි 23 දින ඉදිරිපත් කළ 2014 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා, ඌනතා හා අනෙකුත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ අයිතම 15 ක් සමීක්ෂණයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2013 ඔක්තෝබර් මාසයේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය රු.3,955,370 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණු අතර 2014 වර්ෂයේදී ඒ වෙනුවෙන් එකතුව රු.356,459 ක් නඩත්තු හා සේවා කටයුතු සඳහා වියදම් කර තිබුණද එම වත්කම භෞතික පරීක්ෂාවට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**-------------------------------------------**

අමාත්‍යාංශය සතු මෝටර් රථයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට 2014 නොවැම්බර් 04 දින මුදාහැර තිබුණු අතර එම වාහනය විධිමත් ලෙස පවරා දීමට කටයුතු කර නොතිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1ට අඩු බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු.9,259,284 ක් විය.

(ii). විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ. 8 ආකෘතියෙහි රු.385,675 ක බැරකම් අඩුවෙන් සටහන් කර තිබුණි.

## 3.7 අනුකූල නොවීම්

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 වැනි ව්‍යවස්ථාව | 18,445,037 | උපාධි ප්‍රදානය කිරීමේ ආයතන වශයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන පිළිගැනීම සඳහා හා එම ආයතන සඳහා අවශ්‍ය බලතල පිරිනැමීම සඳහා ඇගයීමේ කාර්යයට අදාලව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අදාල ආයතනවලින් අයකරගත් මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම වෙනුවට පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන එමගින් වියදම් කර තිබුණි. |

| | | |
|---|---|---|
| **(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| 2010 මැයි 14 දිනැති අංක ............. දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3(1) හා 4(1) ජේද | 1,029,380 | අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් උපරිම නිලවාහන සංඛ්‍යාව 3ක් වුවද එම සීමාව ඉක්මවා වාහන 7 ක් අමාත්‍යවරයා වෙත ලබා දී තිබුණු අතර මාසිකව හිමි ඉන්ධන ප්‍රමාණය ඉක්මවා ඉන්ධනද ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 2009 මාර්තු 05 දිනැති අංක 10/2007(1) දරන චක්‍රලේඛය. | 833,460 | අමාත්‍යවරයාට වාර්ෂිකව හිමි ගෙවල්කුලී දීමනා වෙනුවට එම සීමාව ඉක්මවා විදුලි හා ජල බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම කර තිබූ නමුත් වැඩිපුර ගෙවූ මුදල ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.8 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යණය යටතේ එකතුව රු.1,502,230,000 ක්වූ ඇස්තමේන්තුගත පිරිවැයකින් ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,448,856,608 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතියේ ක්‍රීඩා මණ්ඩපය, ශ්‍රවණාගාරය හා ආපනශාලාවේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර ව්‍යාපෘති කාලය 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතු තිබුණි. එම ඉදිකිරීම් පහක භෞතික ප්‍රගතිය 2014 දෙසැම්බර් 31 දිනට සියයට 40 ක ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පැවතුණි.

**(ආ) විදේශාධාර ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කර්මාන්ත අතහැර දැමීම**

අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය අදියර 1-B හි ගිවිසුමේ සඳහන් පරිදි ඉදිකිරීම් 11 ක් යෝජිතව තිබුණු අතර විධිමත් අනුමැතියකින් තොරව ඉන් ඉදිකිරීම් 3ක් අවලංගු කර තිබුණි.

**(ඇ) ව්‍යාපෘති ගිණුම්වල වූ මුදල් ශේෂ**

උසස් තාක්ෂණ ආයතන වැඩි දියුණු කිරීමේ හා යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය 2011 දෙසැම්බර් මාසයේදී අවසන් කර තිබුණත්, එහි ඉතිරි මුදල වූ රු.772,987 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, එම මුදල් ශේෂය බැංකු ජංගම ගිණුමේ නිෂ්ක්‍රීයව රඳවාගෙන තිබුණි.

**(ඈ) විදේශීය ව්‍යාපෘති ඈවර කිරිම**

උසස් තාක්ෂණ ආයතන වැඩි දියුණු කිරීමේ හා යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය 2011 දෙසැම්බර් මාසයේදී අවසන් කර තිබුණත්, එම ව්‍යාපෘතියේ ඈවර කිරීමේ ගිණුම් 2014 දෙසැම්බර් 31 දිනටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ) ව්‍යාපෘති නියමිත දින ආරම්භ නොකිරීම.**

2014 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතව තිබුණු ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 575 ක් වූ කිලිනොච්චිය ඉංජිනේරු පීඨය හා කෘෂිකර්ම පීඨය ඉදිකිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආරම්භ කර නොතිබුණි.

**(ඊ) 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමණාකරන සේවා චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති කාර්යමණ්ඩල බඳවා ගැනීම හා වැටුප් ගෙවීම සිදුකළ යුතු වුවද, අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු 22 ක් පිරවීමට කටයුතු නොකර ඉහළ වැටුප් මත කොන්ත්‍රාත් පදනමට නිලධාරීන් 22 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ii). ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අංශය වෙනුවෙන් සුදුසුකම් රාමුවක් සංවර්ධනය කිරීමට 2014 ජුනි මාසයේදී පොත් 5,000 ක් මුද්‍රණය කිරීමට රු.1,534,999 ක් වියදම් කර තිබුණද, එම පොත්වලින් පිටපත් 4,750 ක් 2015 අප්‍රේල් 30 දින වන විටත් අදාල කටයුතු සඳහා යොදා නොගෙන ව්‍යාපෘති කාර්යාලයෙහි නිෂ්ක්‍රීයව පැවතුණි.

(iii). සම්පත් දායකයන් දෙදෙනකු වෙනුවෙන් ඔවුන් සමඟ ඇතිකරගත් ගිවිසුම්වල සඳහන් කොන්දේසිවලට අමතරව සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන වියදම් සඳහා එකතුව රු.2,037,965ක් වැය කර තිබුණි.

(iv). මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන චක්‍රලේඛයේ 3 (iii) ඡේදය ප්‍රකාරව විදේශගත වන නිලධාරීන් සඳහා අනියම් හා සංයුක්ත දීමනා ගෙවීම් කළ යුතු වුවද, අධ්‍යයන හා වැඩමුළු සඳහා විදේශගතවූ නිලධාරීන් 06 දෙනෙකුට අනියම් හා සංයුක්ත දීමනා රු.119,383 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(v). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 3 වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවට අඩුම වියදමක් වන පරිදි රාජකාරී ගමන්වල යෙදිය යුතු වුවත්, 2014 වර්ෂයේදී විධිමත් අනුමැතියකින් තොරව එකතුව රු.186,400 ක් අභ්‍යන්තර ගුවන් ගමන් වියදම් සඳහා ව්‍යාපෘතියෙන් ගෙවීම් කර තිබුණි.

(vi). ව්‍යාපෘතියට උපදේශන සේවා ලබා ගැනීම වෙනුවෙන් කෙටිකාලීනව පත් කළ උපදේශකයින් 04 දෙනෙකුට විදේශ පුහුණුව ලබාදීමට සමාලෝචිත වර්ෂයේදී රු.2,859,453 ක් වැය කර තිබුණි.

(vii). විදේශ සමුළුවකට සහභාගිවීමට නියමිතව තිබුණු නිලධාරියෙකුට ව්‍යාපෘතිය විසින් රු.432,722 ක් ලියාපදිංචි ගාස්තු, ගුවන් ටිකට් හා වීසා ගාස්තු වෙනුවෙන් වියදම් කර තිබියදී අදාල නිලධාරියා එම සමුළුවට සහභාගි වී නොතිබුණි.

(viii). 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට පටහැනිව ව්‍යාපෘති සේවා කාලය අවුරුදු 4 ක් පමණක් සම්පූර්ණ කර සේවයෙන් ඉවත් වූ නිලධාරීන් තුන් දෙනෙකුට පාරිතෝෂික ලෙස රු.911,247 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

(ix). ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂයේදී වාහන 2 කට රු.1,440,000 ක කුලී ගෙවා තිබුණද, එම වාහන ව්‍යාපෘති කාර්යයන්ට යොදා තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(x). ආයතන සංග්‍රහයේ IV පරිච්ඡේදයේ 3:3 වගන්තිය අනුව මාස 3 ක කාලයකට සීමාවන පරිදි වැඩ බැලීමේ පත්වීමක් ලබා දිය හැකි වුවත්, ව්‍යාපෘතියේ මූල්‍ය කලමනාකරු තනතුර වැඩබැලීමේ පදනම මත රාජ්‍ය සේවයේ පූර්ණකාලීන නිලධාරියෙක් දිගුකාලීනව සේවය කර තිබුණි. එම නිලධාරියා එම ව්‍යාපෘතියේම උපදේශකවරයකු ලෙසද රාජකාරී කිරීම නිසා එම රාජකාරී ත්‍රිත්වයේම කාර්යයන් ඵලදායී ලෙස ඉටු කළ බවට විගණනයේදී තහවුරු වි නොතිබුණි. එම

නිලධාරියා වෙනුවෙන් 2014 වර්ෂයේදී රු.892,667 ක වැටුප් හා දීමනා ව්‍යාපෘතියෙන් ගෙවා තිබුණි.

**3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ක්‍රීඩා අමාත්‍යාංශය වෙනුවෙන් විදේශගත වූ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ නිලධාරියකුට අනියම් දීමනා හා උණුසුම් ඇඳුම් දීමනා ලෙස අමාත්‍යාංශය විසින් රු.117,159 ක් වැය කර තිබුණි.

(ආ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අරමුණුවලට පරිබාහිරවූ අමාත්‍යාංශයේ නොවන කිරිගොවීන් රට යවා පුහුණුවක් ලබාදීමට රු.1,103,381 ක් අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් වැය කර තිබුණි.

(ඇ) 2014 /2015 අධ්‍යයන වර්ෂය සඳහා ප්‍රදානය කළ විදේශ ශිෂ්‍යත්ව 219 කින් භාරගත් ශිෂ්‍යත්ව සංඛ්‍යාව 187 ක් විය. මේ අනුව භාර නොගත් ශිෂ්‍යත්ව සංඛ්‍යාව 32 න් ශිෂ්‍යත්ව 25 ක් ඉන්දියාව විසින් ප්‍රදානය කර තිබුණි.

(ඈ) ප්‍රචාරණ වියදම් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන සළසා නොතිබියදී, නේවාසිකාගාර ඉදිකිරීම සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රූපවාහිනී ගුවන් විදුලි ප්‍රචාරණ කටයුතු සඳහා එකතුව රු.21,979,130 ක් වැය කර තිබුණු අතර ඒ සඳහා ලබාගත් විධිමත් අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

**(අ)** අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

---------------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 19 | 14 |
| (ii) | තෘතියික මට්ටම | 2 | 1 | 1 |
| (iii) | ද්විතියික මට්ටම | 134 | 71 | 63 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 45 | 34 | 11 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 6 | 4 | 2 |
| | **එකතුව** | **220** | **129** | **91** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 91 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| අනියම් කම්කරු | 2 | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| කළමනාකරණ සහකාර | 11 | 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය | 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |

## 4. ශීර්ෂය 214 - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

### 4.1 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 58 | 43 | 15 |
| (ii) | තෘතියික මට්ටම | 27 | 24 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 155 | 99 | 56 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 53 | 48 | 05 |
| | **එකතුව** | **293** | **214** | **79** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 79 ක් පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.